# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 15 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 මැයි මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 15 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 67/73.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 15 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 12 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1963 අංක 4 දරන පනතේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'' (2) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක හෝ සේවා නියුක්තියක ගිණුම්, මාර්තු මස තිස් එක් වන දින නොවන යම් දිනයක් දක්වා සිරිත් පරිදි ඔහු විසින් පිළියෙල කරන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, 1973 අප්‍රේල් මස 1 වන දිනයට පසුව නොවන දිනයකින් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයෙහි ඒ දිනයෙන් අවසන් වන වර්ෂයෙහි ලාභ ප්‍රමාණ අනුව, ඒ ප්‍රභවයෙන් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම් ආගණනය කරන ලෙස කොමසාරිස්වරයා විසින් විධාන කළ හැකි ය. යම් කර්මාන්තයකින්, වෙළෙඳ ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ සේවා නියුක්තියකින් යම් තැනැත්තකුට ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම එක්තරා දිනයක් දක්වා පිළියෙල කරනු ලැබූ ගිණුමට අනුව ආගණනය කරනු ලැබ, ඉක්බිතිව එන වර්ෂයෙහි අනුරූප දිනය දක්වා ගණන් පිළියෙල කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරින අවස්ථාවක, ඒ පැහැර හැරීම සිදු වන තක්සේරු වර්ෂයෙහි ද ඊට ඉක්බිතිව එන තක්සේරු වර්ෂ දෙකෙහි ද ඒ ප්‍රභවයෙන් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම කොමසාරිස්වරයාගේ අභිමතය පරිදි සුදුසු යැයි ඔහු විසින් කල්පනා කරනු ලබන පදනමක් මත (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ආගණනය කළ යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තියෙහි ඉහත දැක්වෙන විධි විධාන යටතේ කරනු ලැබූ විධානයක් යම් වේලාවක කොමසාරිස්වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය :

එසේ ම, තව දුරටත්, කොමසාරිස්වරයා විසින් එවැනි යම් විධානයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක, ඒ විධානය

කරනු ලැබුවේ යම් ප්‍රභවයක් සම්බන්ධයෙන් ද ඒ ප්‍රභවය පිළිබඳ 1973 අප්‍රේල් මස 1 වන දිනයට පසුව නොවන දිනයකින් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ මාර්තු මස තිස් එක් වන දින දක්වා ගණන් පිළියෙල කරනු ලැබුවාක් මෙන් ආගණනය කළ යුතු යයි ඔහු විසින් නියම කළ හැකි ය. '': තව ද

(2) ඒ වගන්තියේ කෙළවරට පහත සඳහන් අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

'' (3) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කර්මාන්තයකින්, වෙළෙඳ ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම (2) වන උපවගන්තිය යටතේ 1973 මාර්තු මස තිස් එක් වන දින නොවන දිනයකින් අවසන් වන වර්ෂයක ලාභ ප්‍රමාණය මත ආගණනය කරනු ලැබූ හෝ ලාභයක් තිබි නම් එසේ ආගණනය කරනු ලැබිය හැකි වූ අවස්ථාවක, 1974 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාට ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම, 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ප්‍රභවයෙන් ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලැබීමට සම්බන්ධ වර්ෂයට ඉක්බිතිව ම එන වර්ෂයේ ආදායම් ප්‍රමාණය සහ 1974 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂයේ ලාභ ප්‍රමාණය යන දෙකින් වඩා වැඩි මුදල මත ආගණනය කළ යුතු ය.

(4) යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන හෝ පවත්වාගෙන යන යම් තැනැත්තකු ඒ කර්මාන්තයේ, වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ගිණුම් 12අ වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව පිළියෙල කිරීම පැහැර හරින අවස්ථාවක, 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ද ඊළඟ තක්සේරු වර්ෂ දෙක සඳහා ද ඒ ප්‍රභවයෙන් ඒ තැනැත්තාට ලැබෙන ව්‍යවස්ථාපිත ආදායම් කොමසාරිස්වරයාගේ අභිමතය පරිදි සුදුසු යයි ඔහු විසින් කල්පනා කරනු ලබන පදනමක් මත ආගණනය කළ යුතුය.''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 12අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 12අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

" ඇතැම් කාල පරිච්ඡේද සඳහා කර්මාන්තවල, වෙළෙඳ ව්‍යාපාර වල, වෘත්තිවල හෝ රක්ෂා වල ගිණුම් පිළියෙල කිරීම නියම කෙරෙන විශේෂ විධිවිධාන.

12අ. (1) 1972 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ කරන ලද යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන හෝ පවත්වාගෙන යන සෑම තැනැත්තකු විසින්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් විධිවිධානවලට අනුකූලව ඒ කර්මාන්තයේ, වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ගිණුම් පිළියෙල කළ යුතු ය :—

(අ) ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායම් 1973 මාර්තු මස 31 වන දින දක්වා පිළියෙල කරන ලද ගිණුමකට යොමු කිරීමෙන් ආගණනය කරනු ලැබූ හෝ ලාභයක් තිබී නම් එසේ ආගණනය කරනු ලැබිය හැකි වූ අවස්ථාවක, ඔහු විසින් ඒ කර්මාන්තයේ, වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ගිණුම් පිළිවෙලින් 1974 මාර්තු මස 31 වන දිනයෙන් සහ 1975 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන මාස දොළහේ අනුක්‍රමික කාලපරිච්ඡේද දෙක සඳහා ද 1975 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන මාස නවයේ කාලපරිච්ඡේද සඳහා ද පිළියෙල කළ යුතු ය :

(ආ) ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වූ ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායම් 1972 දෙසැම්බර් මස 31 වන දින දක්වා පිළියෙල කරන ලද ගිණුමකට යොමු කිරීමෙන් ආගණනය කරනු ලැබූ හෝ ලාභයක් තිබී නම් එසේ ආගණනය කරනු ලැබිය හැකි වූ අවස්ථාවක, ඔහු විසින් ඒ කර්මාන්තයේ, වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ගිණුම් පිළිවෙලින් 1974 දෙසැම්බර් මස 31 වන දිනයෙන් සහ 1975 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන මාස දොළහේ අනුක්‍රමික කාලපරිච්ඡේද දෙක සඳහා පිළියෙල කළ යුතු ය ; තව ද

(ඇ) ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු

වර්ෂය සඳහා වූ ඔහුගේ ව්‍යවස්ථාපිත ආදායම ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනය හෝ මාර්තු මස තිස් එක් වන දිනය නොවන දිනයක් දක්වා පිළියෙල කරන ලද ගිණුමකට යොමු කිරීමෙන් ආගණනය කරනු ලැබූ හෝ ලාභ යක් තිබී නම් එසේ ආගණනය කරනු ලැබිය හැකි වූ අවස්ථාවක, ඔහු විසින් ඒ කර්මාන්ත යේ, වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ගිණුම්—

(i) 1973 අප්‍රේල් මස 1 වන දින සහ 1974 මාර්තු මස 31 වන දින අතර වූ යම් දිනයක් දක්වා ඒ කර්මාන්තයේ, වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ගිණුම් පිළියෙල කරනු ලැබී ද ඒ දිනයට ඉක්බිතිවම එන දිනයෙන් ආරම්භ වී 1974 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලපරිච් ඡේදය සඳහා ද,

(ii) 1974 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී 1975 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන මාස දොළහේ කාලපරිච්ඡේදය සඳහා ද,

(iii) 1975 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී 1975 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන මාස නවයේ කාලපරිච්ඡේදය සඳහා ද,

පිළියෙල කළ යුතු ය.

(2) 1972 අප්‍රේල් මස 1 වන් දින හෝ එදිනෙන් පසු, එහෙත් 1975 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ කරන ලද යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යන හෝ පවත්වා ගෙන යන සෑම තැනැත්තකු විසින්, (4) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් විධිවිධානවලට අනුකූලව ඒ කර්මාන්තයේ, වෙළෙඳ ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේ ගිණුම් පිළියෙල කළ යුතු ය :—

(අ) යම් වර්ෂයක මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදයක් සඳහා ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි පළමු ගිණුම ඔහු විසින් පිළියෙල කරනු ලබන හෝ පිළියෙල කරනු ලැබ ඇති අවස්ථාවක, 1975 මාර්තු මස 31 වන දින දක්වා වූ මාස දොළහේ එක් එක් අනුක්‍රමික කාලපරිච්ඡේදය සඳහා සහ 1975 අප්‍රේල් මස 1 වන දිනයෙන්

ආරම්භ වී 1975 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වූ මාස නවයක කාල පරිච්ඡේදය සඳහා ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් ඔහු විසින් පිළියෙල කළ යුතු ය ;

(ආ) යම් වර්ෂයක දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදයක් සඳහා ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි පළමු ගිණුම් ඔහු විසින් පිළියෙල කරනු ලබන හෝ පිළියෙල කරනු ලැබ ඇති අවස්ථාවක, 1975 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ මාස දෙළහේ එක් එක් අනුක්‍රමික කාල පරිච්ඡේදය සඳහා ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් ඔහු විසින් පිළියෙල කළ යුතු ය ; තව ද

(ඇ) යම් වර්ෂයක මාර්තු මස 31 වන දිනය හෝ දෙසැම්බර් මස 31 වන දිනය නොවන දිනයක අවසන් වන කාලපරිච්ඡේදයක් සඳහා ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි පළමු ගිණුම් ඔහු විසින් පිළියෙල කරනු ලබන හෝ පිළියෙල කරනු ලැබ ඇති අවස්ථාවක—

(i) ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි පළමු ගිණුම පිළියෙල කරන ලද්දේ යම් කාලපරිච්ඡේදයක් සඳහා ද ඒ කාලපරිච්ඡේදයේ අවසන් දිනයට ඉක්බිතිව එළඹෙන දිනයෙහි ආරම්භව ඊළඟට එළඹෙන මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහාත් 1975 මාර්තු මස 31 වන දින දක්වා වූ මාස දෙළහේ එක් එක් අනුක්‍රමික කාලපරිච්ඡේදය සඳහාත්, සහ

(ii) 1975 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1975 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන මාස නවයේ කාලපරිච්ඡේදය සඳහාත්

ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් ඔහු විසින් පිළියෙල කළ යුතු ය.

(3) 1975 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනෙන් පසු යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කරගෙන යාම හෝ පවත්වා ගෙන

යාම ආරම්භ කරන සෑම තැනැත්තකු ම, (4) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව, 1975 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි පළමු ගිණුම් පිළියෙල කළ යුතු ය.

(4) තමා විසින් පවත්වාගෙන යනු ලැබූ හෝ කරගෙන යනු ලැබූ යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සම්බන්ධයෙන් මේ වගන්තියෙහි ඉහත දක්වෙන විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට යම් තැනැත්තකුට නොහැකි වන අවස්ථාවක, ඒ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට තමාට නොහැකිවීමේ හේතු දක්වමින් ලිඛිත දැන්වීමක් ඔහු විසින් කොමසාරිස්වරයාට දිය යුතු ය. එසේ දක්වන ලද හේතුවලින් කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, විධානයෙහි සඳහන් කරනු ලබන කාලපරිච්ඡේදයන් සඳහා ඒ කර්මාන්තයෙහි, වෙළෙඳ ව්‍යාපාරයෙහි, වෘත්තියෙහි හෝ රක්ෂාවෙහි ගිණුම් පිළියෙල කරන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට විධාන කළ හැකි අතර, එම විධානයට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය :

එසේ වුව ද මේ උපවගන්තියෙහි ඉහත දක්වෙන විධිවිධාන යටතේ තමා විසින් කරනු ලැබූ යම් විධානයක් ඕනෑම අවස්ථාවක වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කොමසාරිස්වරයා විසින් කළ හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ආ) ලාභයක් තිබී නම් මේ පනත යටතේ තක්සේරු කළ හැකි වූ, යම් කර්මාන්තයකින්, වෙළෙඳ ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් 1974 අප්‍රේල් මස 1 වන දිනයට පසුව නොවන දිනයකින් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්, ඒ තක්සේරු වර්ෂය තුළ ඔහු විසින් දරනු ලැබූ අලාභයක මුදල, සහ 1975 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, 1975 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන මාස නවයේ කාල පරිච්ඡේදය තුළ ඔහු විසින් දරනු ලැබූ අලාභයක මුදල :

එසේ වුව ද එවැනි අඩු කිරීමක් සඳහා වූ හිමිකම් පෑමක්, ඒ තක්සේරු වර්ෂය අවසාන වීමට මාස හයක් ඇතුළත ලිඛිත දැන්වීමකින් කරනු ලැබුවහොත් මිස ඒ අඩු කිරීම නොකළ යුතු ය ; ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 15අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

15අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"1974 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1975 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ සඳහා ඇතැම් අලාභ සම්බන්ධයෙන් සහනය දීම.

15අ. 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා කර්මාන්තයකින්, වෙළෙඳ ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් යම් තැනැත්තකුගේ ව්‍යවස්ථාපිත ආදායම 12 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මාර්තු මස තිස් එක වන දින නොවන දිනයක් දක්වා පිළියෙල කරන ලද ගිණුමකට යොමු කිරීමෙන් ආගණනය කර ඇති අවස්ථාවක, හෝ ලාභයක් තිබී නම් එසේ ආගණනය කරනු ලැබිය හැකි වූ අවස්ථාවක, සහ 1974 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය තුළ හෝ 1973 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වූ ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරන ලද්දේ යම් වර්ෂයකට අදාළව ද ඒ වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය තුළ හෝ ඒ දෙවර්ෂය ම තුළ ඒ කර්මාන්තයෙන්, වෙළෙඳ ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ඒ තැනැත්තා අලාභයක් විඳින අවස්ථාවක, 1974 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කිරීමේදී සැලකිල්ලට භාජනය නොකරනු ලැබූ හෝ 15 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කිරීමක් වශයෙන් අවසර නොදෙනු ලැබූ ඒ අලාභයෙහි ඒ කොටස සම්බන්ධයෙන් 1974 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1975 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ දෙක සඳහා හෝ එම තක්සේරු වර්ෂ දෙකෙන් යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ සාධාරණ යයි තමා විසින් සැලකිය හැකි සහනයක් කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි ය. ".